දෙපාර්තමේන්තු චක්‍ර ලේඛ අංක : 32 /2010

මගේ අංකය - කේ.03/51/ 223 /10
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09,
2010.11. 09 වෙනි දින.

සියලුම බන්ධනාගාර අධිකාරීන්,
සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත.

## 2011 වසරට ආගමික වතාවත් සඳහා පූජකවරුන් පත්කිරීම

2011 වසර සඳහා දිවයිනේ සියලුම බන්ධනාගාර වල ඒ ඒ ආගමික සිරකරුවන් හට ආගමික වතාවත් කිරීම සඳහා පූජකවරුන් පත්කල යුතුව ඇත.

02. ඒ සඳහා පහත සඳහන් ආදර්ශයට අනුව , සකස් කල ආගමික පූජකවරුන්ගේ නාම ලේඛණයක් 2010.12.15 වෙනි දිනට පෙර ඔබගේ නිර්දේශය සහිතව මා එවිය යුතුය.

03. දැනට පත්කර ඇති පූජකවරුන්ගේ නිල කාලය 2010.12.31 වෙනි දිනට අවසන්වන බැවින් , 2011 වසරට පූජකවරුන් පත් කිරීමට අවශ්‍ය විස්තර සැපයීමට ආයතන භාර අධිකාරී වරයා / සහකාර අධිකාරී වරයා විසින් වග බලා ගත යුතුය. දැනට පත්කර ඇති පූජකවරුන්ගේ සේවය සම්බන්ධව ඔබ සෑහිමකට පත්නොවන්නේ නම් ඔවුන්ගේ නම් ඉවත් කිරීමට හේතුද , දැක්විය යුතුය. සියළුම සිරකරුවන් / සැකකරුවන් වෙනුවෙන් ඔවුන් අදහන ආගම අනුව , පූජකවරුන් පත් කිරීම සඳහා අවශ්‍ය විස්තර සැපයීම ආයතන භාර අධිකාරී/සහකාර අධිකාරී වරයාගේ වගකීමක් බව සඳහන් කරමි.

04. එල්.ටී.ටී.ඊ සැකකරුවන් රඳවා සිටින ආයතන සඳහා පත් කිරීමට නිර්දේශ පූජකවරුන් වෙනුවෙන් පොලිස් වාර්ථා ලබා ගෙන අදාල නාම ලේඛන සමග ඉදිරිපත් කිරීමට ආයතන භාර අධිකාරී වරයා විසින් කටයුතු කල යුතුය.

05. පසුගිය වසරේ පත්කරන ලද පූජකවරුන්ගේ නම් ලැයිස්තුවට අනුව , ආගමික කටයුතු පැවැත්වීම සඳහා එක් එක් ආගම වෙනුවෙන් පත්කරනු ලබන පූජකවරුන් සංඛ්‍යාව එම ආගමේ ප්‍රධාන පූජකවරයා සමග සාකච්ජා කර තෝරා ගෙන අදාල නම් පමණක් ආයතන භාර අධිකාරී වරයාගේ නිර්දේශය සහිතව එවීමට කටයුතු කල යුතුය.

06. 2011 වසර සඳහා පූජකවරුන් පත් කිරීමේ නාම ලේඛණය නියමිත දිනට මූලස්ථානයට නොලැබීම හේතුවෙන් දැඩි දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදුවිය. එබැවින් , 2011 වසර සඳහා පූජකවරුන් පත් කිරීමේ නාම ලේඛනය නියමිත දිනට එවීමට ඔබ විසින් වග බලාගත යුතු බවට මෙයින් දන්වමි.

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

### 2011 වසර සඳහා පූජකවරුන් පත් කිරීම

.................................. බන්ධනාගාරය

| බෞද්ධ | කතෝලික | ඉස්ලාම් | මෙතෝදිස්ත | හින්දු | වෙනත් ආගම් |
|---|---|---|---|---|---|
| | | | | | |